දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2694860
Fax )

විද්‍යුත් තැපැල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
E-mail )

වෙබ්අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
Website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )FHB/SH/Let/2021
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி )2021.02. 15
Date )

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

---

මහාචාර්ය කපිල පෙරේරා,

ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය

**<u>COVID-19 වසංගත ව්‍යාප්ති කාල සීමාව තුළ ජාතික මට්ටමේ විභාග පැවැත්වීම සඳහා වූ මාර්ගෝපදේශය</u>**

මෙම මාර්ගෝපදේශය 2020 මැයි මාසයේදී නිකුත් කරන ලද "COVID - 19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සිදු කරන ආකාරය පිළිබඳව උපදෙස්" සඳහා වූ මාර්ගොපදේශයට අමතරව වේ.

මෙම මාර්ගෝපදේශය අධ්‍යාපන අමාත්‍යාංශයේ විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ (අ.පො.ස.(සා.පෙළ)) විභාගය පැවැත්වීම සඳහා විශේෂයෙන් පිළියෙළ කරන ලද අතර, මීට අමතරව " COVID-19 වැළැක්වීම පිළිබඳ මහජනතාව සඳහා පොදු මාර්ගෝපදේශය" ද මෙයට අදාළ වේ.

පොදු උපදෙස්

1. ඕනෑම හදිසි අවස්ථාවකදී මැදිහත් වීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

2. විභාග අපේක්ෂකයින් සඳහා පාසල තුල සිදු කෙරෙන සියලුම ක්‍රියාකාරකම් හෝ සිසුන් පාසලට පැමිණීම අවශ්‍ය වන සියලු කටයුතු විභාගය ආරම්භක දිනයට සති දෙකකට පෙර අවසන් කළ යුතුය.

විශේෂිත උපදෙස්

<u>විභාග කටයුතු කළමනාකරණ / සංවිධායක මණ්ඩලය සඳහා උපදෙස්</u>

1. විභාග පැවැත්වීමට අදාල ව දෙපාර්තමේන්තුව මගින් සැලසුම් කර ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ අදාල උපදෙස් පිළිපදින බවට තහවුරු කිරීම සඳහා එක් එක් විභාග මධ්‍යස්ථානය සඳහා වගකිවයුතු නිලධාරියෙකු පත් කිරීම.

2. විභාග කටයුතු සඳහා සම්බන්ධ වන සියළුම කාර්ය මණ්ඩලයට COVID-19 වැළැක්වීමට අදාළ පූර්වාරක්ෂණ පිළිවෙත් සහ සනීපාරක්ෂණ පිළිවෙත් පිලිබඳ උපදෙස් ලබා දිය යුතුය; දෙඅත් සබන් යොදා වතුරෙන් නිසි ලෙස සේදීම; ශාරීරික දුරස්ථභාවය පවත්වා ගැනීම. නිවැරදි ආකාරයට මුහුණු ආවරණ පැළඳීම සහ ශ්වසන ආචාර විධි පිළිපැදීම (කිවිසුම් යාම / කැස්ස ඇති විට වැලමිටෙන් මුඛය සහ නාසය ආවරණය කිරීම).

3. විභාග කටයුතු සඳහා සම්බන්ධ වන සියළුම කාර්ය මණ්ඩල සහ විභාග අපේක්ෂකයන් තම නම, ලිපිනය, සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ විස්තර සහ තමා නිරෝධායනයට යොමු කර හෝ හුදෙකලා කර ඇති ප්‍රදේශයකින් පැමිණි අයකු නොවන බව අවධාරණය කරමින් ප්‍රකාශනයක් ඉදිරි පත් කළ යුතුවේ.

4. විභාගයට පෙනී සිටින සියළුම අපේක්ෂකයින්ගේ නම,දුරකථන අංකය, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, විභාග මධ්‍යස්ථානය සහ ඒ ඒ අපේක්ෂකයින් මුහුණ දීමට නියමිත විෂයයන් සහ ඊට අදාළ මාධ්‍යය පිළිබඳ විස්තර ඇතුළත් දත්ත ලැයිස්තුවක් ජාතික මට්ටමෙන් මෙන්ම ප්‍රාදේශීය මට්ටමින් ද පවත්වා ගත යුතුවේ.

5. විභාගය පැවැත්වෙන දිනට පෙර, COVID-19 වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන පිළිවෙත් පිලිබඳ සියලුම අපේක්ෂකයින් දැනුවත් කල යුතුය. එය නැවත විභාගය ආරම්භ වීමට පෙර විභාග මධ්‍යස්ථානය තුලදී දැන්වීම් සහ පෝස්ටර් ආධාරයෙන් දැනුම් දිය යුතුය.

6(අ). සියළුම අපේක්ෂකයින්ට COVID-19 රෝගය ආශ්‍රිත විමසීම් සඳහා ක්ෂණික දුරකථන අංකයක් ලබා දිය යුතුය. උණ / ශ්වසන රෝග ලක්ෂණ පිලිබඳ කල්තියා දැනුම් දීමට සහ අවශ්‍ය කටයුතු සූදානම් කිරීමට මෙම දුරකථන අංකය භාවිතා කල යුතුය.

6(ආ). අපේක්ෂකයෙකු COVID-19 ආසාදිතයකු බවට තහවුරු කල හොත්, නම් කරන ලද රෝහලකට / ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඔවුන් ඇතුළත් කළ යුතුය. එම අපේක්ෂකයා වෙනුවෙන් විභාගය පැවැත්වීම සඳහා වෙනම ස්ථානයක් පිළියෙල කිරීමට රෝහල් අධ්‍යක්ෂ / වෛද්‍ය අධිකාරී /

ආයතන භාර වෛද්‍ය නිලධාරීවරයා සමග කටයුතු කළ යුතුය. රෝහලේ / ප්‍රතිකාර මධ්‍යස්ථානයේදී විභාගය පැවැත්වීමට අදාල කටයුතු සම්බන්ධීකරණය සහ අවශ්‍ය සහයෝගය ලබා දීම අධ්‍යාපන නිලධාරීන් මගින් සිදු කල යුතුවේ.

6(ඇ). කිසියම් අපේක්ෂකයෙකු COVID-19 බවට පිළිබඳ සැක කල හැකි රෝග ලක්ෂණ සහිතව රෝහල් ගත කර ඇත්නම්, රෝහල් අධ්‍යක්ෂ / වෛද්‍ය අධිකාරී / ආයතන භාර වෛද්‍ය නිලධාරී වරයා විසින් විභාගය පැවැත්වීම සඳහා රෝහල තුළ වෙනම ස්ථානයක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

6(ඈ). විභාගය පවත්වන දිනයේදී අපේක්ෂකයෙකු නිරෝධායනය කර හෝ හුදෙකලා කර ඇති ස්ථානයක සිටී නම්, ඔහු/ඇය සඳහා විභාගය පැවැත්වීමට වෙනම විභාග මධ්‍යස්ථානයක් සංවිධානය කළ යුතුය. කෙසේ වෙතත්, හුදෙකලා කර ඇති ප්‍රදේශයේ සිටින්නේ අපේක්ෂකයින් ඉතා ස්වල්පයක් නම්, ළඟම ඇති විභාග මධ්‍යස්ථානයේ වෙනම ගොඩනැගිල්ලක සුදුසු කාමරයක් සකස් කළ හැකිය. අපේක්ෂකයාට විභාගයට සහභාගී වීම සඳහා පමණක් හුදෙකලා කර ඇති ප්‍රදේශයෙන් පිටවීමට විභාග අයදුම් පත්‍රය අවසර පත්‍රයක් ලෙස භාවිතා කල හැකිය.

6(ඉ). කිසියම් අපේක්ෂකයකු, විභාග මධ්‍යස්ථානයට පැමිණීමෙන් පසු, COVID-19 ආශ්‍රිත රෝග ලක්ෂණ ගැන පැමිණිලි කල හොත් ඔහු /ඇය වෙන් කර විභාගය පැවැත්වීම සඳහා මධ්‍යස්ථානය තුළ සුදුසු කාමරයක් සකස් කොට තැබිය යුතු අතර, එම අපේක්ෂකයාට එදින විභාගය දිගටම කරගෙන යාමට සැලැස්විය යුතුයි. රෝග ලක්ෂණ සහිත අපේක්ෂකයා ශාලාවේ සිටින අනෙක් අයගෙන් වෙන් කිරීමට සියලු පූර්වාරක්ෂණ පිළිවෙත් සිදු කළ යුතුය. එම අපේක්ෂකයාට විභාගය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් සැපයීමට ක්‍රියා කල යුතුය.

6(ඊ). හුදෙකලා කර ඇති ප්‍රදේශවල සිසුන්ට සහ නිරෝධායනය කර ඇති අයට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා අධ්‍යාපන නිලධාරීන් අදාළ වෙනත් රජයේ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කළ යුතුය.

6(උ). රෝහල් / ප්‍රතිකාර මධ්‍යස්ථාන / නිරෝධායන මධ්‍යස්ථානවල සහ හුදෙකලා කර ඇති ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටින නිලධාරීන්ට පෞද්ගලික ආරක්ෂණ උපකරණ ලබා දිය යුතුය.

6(ඌ). රෝහල් පරිශ්‍රය තුළ විභාගය පවත්වන විට, අවශ්‍ය නම් ඒ සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩල වල සහය ලබා ගත යුතුවේ.

7. විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීමේ හා පිටවීමේ ක්‍රියාවලිය විධිමත් ව සැලසුම් කළ යුතු අතර, අත් සේදීම, ලියාපදිංචි කිරීම, අපේක්ෂකයින්ගේ ගමන් මලු සහ පොත් පත් තබන ස්ථාන වලදී තදබදය අවම වන පරිදි අවශ්‍ය පහසුකම් සැලැස්විය යුතුවේ.

8. විභාග ශාලාවට පිවිසෙන සියලු දෙනා සඳහා සබන් හා ජලය සමග අත් සේදීම ට අවශ්‍ය පහසුකම් සැපයිය යුතුයි (පාදයෙන් හෝ සංවේදක මගින් ක්‍රියා කරන කරාම වඩාත් සුදුසුය). එවැනි පහසුකම් සැපයිය නොහැකි නම්, විභාග ශාලාවට පිවිසෙන දොරටුවේ සනීපාරක්ෂක දියර මගින් අත් පිරිසිදු කිරීමට පහසු කම් සැලැස්විය යුතුයි. විභාග ශාලාවට ඇතුළු වීමට පෙර අත් පිරිසිදු කර ගන්නා ලෙස සියලුම සිසුන්ට උපදෙස් දිය යුතුය. ඉහත ක්‍රියාවලිය නිසියාකාරව සිදුවන බවට සහතික කිරීම සඳහා ආචාර්යවරයකු/නිලධාරියකු පත් කල කළ යුතුවේ.

9. විභාග මධ්‍යස්ථානයට පිවිසෙන දොරටුවේ දී විභාග කටයුතු සඳහා සම්බන්ධ වන සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහ අපේක්ෂකයින්ගේ සෞඛ්‍යය තත්වය පිළිබඳ (උණ සහ කැස්ස / සෙම්ප්‍රතිශ්‍යාව වැනි ශ්වසන රෝග ලක්ෂණ) විමසීම සඳහා වැඩපිළිවෙලක් සකස් කල යුතුවේ.

10. උණ පරීක්ෂා කිරීම සඳහා උෂ්ණත්වමාන භාවිතා කළ හැකි නමුත් එය අත්‍යවශ්‍ය නොවේ. මධ්‍යස්ථානයට ඇතුල් වන දොරටුවේදී උෂ්ණත්වය පරීක්ෂා කිරීමට අවශ්‍ය නම්, ස්පර්ශ නොවන(අධෝරක්ත කිරණ භාවිතා වන) උපාංග වඩාත් සුදුසු වන අතර ඒවායේ නිසි භාවිතය පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කළ යුතුය.

11. විභාග කටයුතු සඳහා සම්බන්ධ වන කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට උණ / ශ්වසන රෝග ලක්ෂණ ඇති වූවහොත් ඔහු/ඇය විභාග මධ්‍යස්ථානයට පැමිණීමෙන් වැළකිය යුතුයි. ඔහු/ඇය හැකි ඉක්මනින් ඒ බව විභාග මධ්‍යස්ථානාධිපතිට දැන්විය යුතු අතර ඒ වෙනුවට වෙනත් නිලධාරියකු සූදානම් කිරීමට ක්‍රියාකල යුතුයි.

12. විභාග ශාලාවට කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ අපේක්ෂකයින් ඇතුල් කිරීමට පෙර සහ ඔවුන් ඉවත් වීමෙන් පසු විභාග ශාලාව විෂබීජහරණය කළ යුතු අතර දිනකට විභාග සැසි කිහිපයක් පවත්වන්නේ නම් අදාළ නම් සැසි අතර තුර ද මේ ක්‍රියාවලිය සිදු කල යුතුයි.
( මේස, දොර හැඬල, පඩි පෙළ අත් වැට, සෝපාන බොත්තම් සහ පොදුවේ ස්පර්ශ වන වෙනත් පෘෂ්ඨ මතු පිට විෂබීජහරණය කිරීම මෙයට ඇතුළත් ය).

13. පැමිණීම අත්සන් කිරීම සඳහා අපේක්ෂකයින්හට තමන්ගේම පෑනක් භාවිතා කරන ලෙස ඉල්ලා සිටිය යුතුය.

14. විභාග කටයුතු සඳහා සම්බන්ධ වන කාර්ය මණ්ඩලය සහ අපේක්ෂකයින් විසින් මුහුණු ආවරණයක් නිරන්තරයෙන් පැළඳිය යුතුය.

15. පාවිච්චි කරන ලද ද්‍රව්‍ය ඉවතලීම සඳහා (කඩදාසි, අත් පිස්නා, ටිෂූ කඩදාසි) හොඳින් වසා තැබිය හැකි අපද්‍රව්‍ය බඳුනක් ලබා දිය යුතුය.

16. හැකි සෑම විටම විභාග ශාලාවට හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි සකසා ගත යුතුය. ස්වාභාවික වාතාශ්‍රය ලබා ගත හැකි ශාලා තෝරා ගැනීම වඩාත් සුදුසුය. වායු සමීකරණ සහිත ශාලා භාවිත කිරීමෙන් වළකින්න.

17. දොර හැඬල ස්පර්ශ කිරීම අවම කිරීම සඳහා විභාග ශාලාවට පිවිසෙන සියලුම දොරවල් අපේක්ෂකයන් ශාලාවට ඇතුළු වීමට පෙර සහ ඔවුන් පිට වීමට පෙර විවෘත කර තැබිය යුතුය.

18. එක් එක් අපේක්ෂකයා අතර අවම වශයෙන් මීටරයක දුරක් පවතින සේ විභාග අපේක්ෂකයන් ගේ මේස සකස් කල යුතුය.

19. කිසිදු ආකාරයක ලිපි ද්‍රව්‍ය හෝ උපකරණ (උදා: කැල්කියුලේටර, ලොග් වගු ,පත්‍රිකා) අතින් අත යැවීමෙන් වැළකිය යුතුය.

20. ජලය පානය කිරීමට ඉවත දැමිය හැකි කෝප්ප ලබා දීම හෝ අපේක්ෂකයින්ට තමන්ගේම වතුර බෝතල් රැගෙන ඒමට උපදෙස් දිය යුතුය.

21.විවේක කාල වලදී / විභාගය අතර තුරදී සිසුන් එකිනෙකා සමඟ මිශ්‍ර වීමට, ආහාරපාන බෙදා ගැනීමට ඉඩ නොදිය යුතුය.

22. ප්‍රායෝගික පරීක්ෂණ/වාචික පරීක්ෂණ/සම්මුඛ පරීක්ෂණ

22 (අ). ප්‍රායෝගික පරීක්ෂණ සඳහා සිසුන් වැඩි අවදානම් සහිත ප්‍රදේශවලට නොයැවිය යුතුය.

22 (ආ). පොදු භාණ්ඩ සහ උපකරණ භාවිතය අවම විය යුතුය.පොදුවේ ස්පර්ශ කරන / හුවමාරු වන උපකරණ අවම වන පරිදි සංවිධානය කල යුතුය (උදා: මුද්‍රිත ප්‍රශ්න පත්‍ර වෙනුවට ප්‍රදර්ශන පුවරු භාවිතා කළ හැකිය). ප්‍රායෝගික පරීක්ෂණ වලදී භාවිතා කරන සියලුම උපකරණ එක් එක් අපේක්ෂකයාගේ පරිහරණයෙන් පසු විෂබීජහරණය කළ යුතුය.

**22(ඇ).** සියලුම අපේක්ෂකයන් සහ පරීක්ෂක / අධීක්ෂකවරුන් ප්‍රායෝගික පරීක්ෂණ/වාචික පරීක්ෂණ/සම්මුඛ පරීක්ෂණ වලදී මුහුණු ආවරණ පැළඳිය යුතුය. මුහුණු ආවරණ පැළඳීම පරීක්ෂණ ක්‍රියා වලියට බාධා වන්නේ නම් පමණක් අවම වශයෙන් මීටර 2ක දූරස්ථ භාවයක් පවත්වා ගනිමින් විභාගය පැවැත්විය හැකිය. මේ සඳහා හොඳින් වාතාශ්‍රය ලැබෙන කාමරයක් වඩාත් සුදුසු වේ.

**22(ඈ).** උණ / ශ්වසන රෝග ලක්ෂණ ඇති අපේක්ෂකයින් විභාගය පැවැත්වෙන කාලසීමාව පුරාම මුහුණු ආවරණ පැළඳිය යුතුය.ඔවුන් සඳහා වෙනත් අපේක්ෂකයින්ගෙන් වෙන්වූ ස්ථානයක් සකසන්න. හොඳින් වාතාශ්‍රය ලැබෙන කාමරයක් වඩාත් සුදුසු ය.
විභාග අපේක්ෂකයාට අසාධාරණයක් නොවන පරිදි අවශ්‍ය නම් වෙනත් පහසු දිනයක් ලබාදී විභාගය පැවැත්වීම කල් දැමීම පිළිබඳව සලකා බැලිය හැකිය.

<u>දෙමාපියන් / භාරකරුවන් සඳහා උපදෙස්</u>

1. විභාග කාලය තුළ ඔබේ දරුවාට උණ / කැස්ස / උගුරේ අමාරුව වැනි COVID-19 රෝග ලක්ෂණ ඇත්නම්, ඔබ ඔබේ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ගෙන් උපදෙස් ලබා ගත යුතුය.

2. ඔබේ දරුවා COVID -19 රෝගියකු බව තහවුරු වුවහොත් හෝ COVID -19 රෝගී ආශ්‍රිතයකු නිසා නිරෝධායනය වීමට සිදු වුව හොත් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ගේ උපදෙස් අනුව ක්‍රියා කල යුතුය.

3. ඔබ නිරෝධායනය කර ඇත්නම් සහ ඔබේ දරුවා සඳහා විභාග මධ්‍යස්ථානයට ප්‍රවාහනය කිරීමට අපහසු නම්, ප්‍රාදේශීය ලේකම් හෝ පාසල් විදුහල්පති දැනුවත් කර ඒ සඳහා සහාය ලබා ගත යුතුවේ.

විභාග අපේක්ෂකයන් සඳහා උපදෙස්

**1.** විභාග අපේක්ෂකයන් වන ඔබ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක /ලිපිනය නිවැරදිව විභාග කටයුතු කළමනාකරණ / සංවිධායක මණ්ඩල වෙත ලබා දෙන්න.
පාසලේ විදුහල්පති /මහජන සෞඛ්‍ය පරීක්ෂක/ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාට නිවැරදි සම්බන්ධතා තොරතුරු ලබා දිය යුතුය.

**2.** COVID-19 වැළැක්වීම සම්බන්ධයෙන් විභාග කටයුතු කළමනාකරණ / සංවිධායක මණ්ඩලය විසින් ලබා දී ඇති පහත උපදෙස් පිළිපදින්න.

- ශ්වසන ආචාර විධි (කැස්ස හෝ කිවිසුම් යාමේදී ඔබේ වැලමිටේ ඇතුළත පැත්ත යොදා ගෙන මුඛය,නාසය ආවරණය කිරීම)
- සබන් හා වතුරෙන් නිතිපතා අත් සේදීම
- නාසය සහ මුඛය ආවරණය වන පරිදි මුහුණු ආවරණයක් නිවැරදිව පැළඳීම
- ඔබ සහ අනෙක් අය අතර සෑම විටම අවම වශයෙන් මීටරයක දුරක් පවත්වා ගෙන යන බවට සහතික වන්න
- ඇතුල්වීමේදී, ලියාපදිංචි කිරීමේ මේසයේදී, අත් සේදීමේ දී,ආපනශාලා තුලදී එක් රැස් වීමෙන් වලකින්න
- ආහාර පාන ආදිය හුවමාරු කර ගැනීමෙන් හෝ එක ළඟ හිඳ කෑම ගැනීමෙන් වලකින්න . ඔබ ආහාර ගන්නා විට එකිනෙකා අතර මීටර දෙකක පරතරයක් පවත්වා ගත යුතුය.
- හැකි තාක් දුරට විභාග කටයුතු සඳහා අවශ්‍ය වන උපකරණ (උදා: කැල්කියුලේටර) ඔබ පෞද්ගලිකව රැගෙන එන්න.
- විභාගයට පෙර සහ පසු පරිශ්‍රයේ අනවශ්‍ය ලෙස රැඳී නොසිටින්න.

**3.** විභාගයට පෙර **COVID-19** රෝග ලක්ෂණ මතු වුවහොත්, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී / මහජන සෞඛ්‍ය පරීක්ෂක/ පාසල් විදුහල්පති වෙත ඉක්මනින් දැනුම් දිය යුතුවේ.
විභාගය පැවැත්වෙන විට ඔබට උණ / කැස්ස / උගුරේ අමාරුව වැනි රෝග ලක්ෂණ ඇති වුවහොත් මධ්‍යස්ථානාධිපති /ශාලාවේ ප්‍රධාන අධීක්ෂක වරයාට දැනුම් දෙන්න.

**4.**උණ / ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් සෑම විටම මුහුණු ආවරණ පැළඳ සිටිය යුතු අතර ඔවුන් සඳහා වෙන් කර ඇති කාමර වල සිට විභාගයට සහභාගී විය යුතුය.

**5.** ඔබ **COVID-19** ආසාදිත බවට හඳුනාගත හොත්, ඔබව රෝහලකට / ප්‍රතිකාර මධ්‍යස්ථානයකට මාරු කරනු ලබන එම රෝහලේ සිට විභාගයට පෙනී සිටීමට අවස්ථාව සැලසේ. තමාගේ පොත් පත් රෝහල / ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත ගෙන යා හැකිය.

උපදෙස් ලබා දෙන ක්‍රමය

සියලුම අපේක්ෂකයින් සඳහා විභාග කටයුතු කළමනාකරණ / සංවිධායක මණ්ඩලය විසින් උපදෙස් නිකුත් කළ යුතුය.

විභාග මධ්‍යස්ථානය තුළ සුදුසු ස්ථාන වල **COVID-19** වැළැක්වීමේ පියවර, දැන්වීම් / සංඥා මගින් ප්‍රදර්ශනය කළ යුතුය (මුහුණු ආවරණයක් පැළඳීම, විභාග මධ්‍යස්ථානයට ගමන් කිරීමට පෙර සහ පසු අත් සේදීම; අනෙක් අයගෙන් අවම වශයෙන් මීටරයක්වත් භෞතික දුර පවත්වා ගැනීම; ශ්වසන ආචාර විධි).

ඉහත සඳහන් කරුණු ඔබගේ අමාත්‍යාංශයට / දෙපාර්තුමේන්තුවට අදාල නිලධාරීන් වෙත ලබා දීමට කටයුතු කරන්න.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය අසේල ගුණවර්ධන

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

ලේකම් / සෞඛ්‍ය අමාත්‍යාංශය

විභාග කොමසාරිස්,විභාග දෙපාර්තුමේන්තුව

අතිරේක ලේකම් / මහජන සෞඛ්‍ය / සෞඛ්‍ය අමාත්‍යාංශය

අතිරේක ලේකම් / පාසල් කටයුතු / අධ්‍යාපන අමාත්‍යාංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මහජන සෞඛ්‍ය I / II

ප්‍රධාන වසංගතවේදී

අධ්‍යක්ෂ / මාතෘ හා ළමා සෞඛ්‍ය

අධ්‍යක්ෂ / සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය

අධ්‍යාපන අධ්‍යක්ෂ / සෞඛ්‍ය හා පෝෂණ / අධ්‍යාපන අමාත්‍යාංශය

සියලුම පළාත් ප්‍රධාන ලේකම් වරුන්

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සියලුම දිස්ත්‍රික් ලේකම් වරුන්

සියලුම ප්‍රජා වෛද්‍ය විශේෂඥ වරුන් / පළාත් සහ දිස්ත්‍රික්

සියලුම වෛද්‍ය නිලධාරීන් / මාතෘ හා ළමා සෞඛ්‍ය

සියලුම ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥයින්

සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්